# PRIME ENTRY BOOKS
# (Part-V)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# ගැනුම් ජර්නලය

වෙළඳ භාණ්ඩ ණයට ගැනුම් සටහන් කිරීම සඳහා පවත්වා ගෙන යන මූලික සටහන් පොත, ගැනුම් ජර්නලය හෙවත් ගැනුම් පොත වේ.

# ගැනුම් ජර්නලයට අදාළ මූලාශ්‍ර ලේඛනය

ගැනුම් ජර්නලයට අදාළ මූලාශ්‍ර ලේඛනය ඉන්වොයිසිය වේ (ගැනුම් ඉන්වොයිසිය).

# වෙළඳ වට්ටම්

වෙළඳ භාණ්ඩ ණයට ගැනීමේ දී භාණ්ඩවල ලකුණු කළ මිලෙන් යම් ප්‍රතිශතයක් අඩු කරන අතර, එය වෙළඳ වට්ටම් ලෙස හඳුන්වනු ලැබේ.

වෙළඳ වට්ටම් ඉන්වොයිසියෙන් අඩු කර දැක්වීම පමණක් සිදු කරයි. ගිණුම්ගත නොකරයි.

# වෙළෙඳ ණයහිමියන්

ව්‍යාපාරයට භාණ්ඩ ණයට සපයන සැපයුම්කරුවන් ව්‍යාපාරයේ වෙළෙඳ ණයහිමියන් වන අතර එම ණයහිමියන් ව්‍යාපාරයේ වගකීමක් ලෙස සැලකේ.

ClassWork.LK

# VAT සඳහා ලියාපදිංචි වූ ආයතනයක ගැනුම් ජර්නලයක ආකෘතිය

### ගැනුම් ජර්නලය

| දිනය | ඉන්වොයිසි අංකය | සැපයුම්කරු | වටිනාකම (රු.) | වැට් VAT (රු.) | මුළු වටිනාකම (රු.) | ලෙජර් පිටුව |
|---|---|---|---|---|---|---|
| 2017/03/01 | 264 | මානෙල් සහ සමාගම | ×× | × | ××× | |
| 2017/03/25 | 610 | කුමාර සහ සමාගම | ×× | × | ××× | |
| 2017/03/31 | | පොදු ලෙජජරයට පිටපත් කළා | ×× | ×× | ××× | |

ඒ ඒ දිනයන්හි VAT ඇතුළත් මුළු ණයහිමි වටිනාකම ණයහිමි උපලෙජයේ අදාළ ණයහිමි ගිණුම්වලට වෙන් වෙන් ව බැර කළ යුතුයි.

කාලච්ඡේදය අවසානයේ දී ගැනුම් ජර්නලයේ වටිනාකම් තීරුවේ එකතුව පොදු ලෙජරයේ ගැනුම් ගිණුමට හර කළ යුතු අතර VAT තීරුවේ එකතුව VAT ගිණුමට හර කර, පසුව VAT ද ඇතුළත් මුළු වටිනාකම තීරුවේ එකතුව ණයහිමි පාලන ගිණුමට බැර කළ යුතුයි.

ClassWork.LK

# ගැනුම් ජර්නලයේ අදාළ ගනුදෙනු ලෙරජයට පිටපත් කිරීම

| | | | |
|---|---|---|---|
| ගැනුම් ගිණුම | හර | → | ගැනුම් ජර්නලයේ වටිනාකම් තීරුවේ එකතුව |
| වැට් ගිණුම | හර | → | වැට් තීරුවේ එකතුව |
| ණයහිමි පාලන ගිණුම බැර | | → | වැට් සහිත ගැනුම්වල මුළු වටිනාකම |

ClassWork.LK

## ආපසු යැවුම් ජර්නලය

ආපසු යැවුම් සටහන් කිරීම සඳහා භාවිත කරන මූලික සටහන් පොත ආපසු යැවුම් ජර්නලය හෙවත් ආපසු යැවුම් පොත වේ.

## හරපත

ආපසු යැවුම් ජර්නලයේ ගනුදෙනු සටහන් කිරීමට භාවිත කර ගන්නා මූලාශ්‍ර ලේඛනය හරපත වේ.

## ණයට ගත් වෙළෙඳ භාණ්ඩ සැපයුම්කරුවන් වෙත ආපසු යැවීමට හේතු

- කාලය ඉකුත් වීම.
- ඇණවුමට අනුකූල නොවීම.
- නශ්‍ය වූ භාණ්ඩ එවා තිබීම.
- ඇණවුම් කාලයෙන් පසුව ලැබීම.

ClassWork.LK

# ආපසු යැවුම් ජර්නලයක ආකෘතිය

ආපසු යැවුම් ජර්නලය

| දිනය | හරපත් අංකය | සැපයුම්කරු | වටනාකම (රු.) | වැට් (රු.) | මුළු වටිනාකම (රු.) | ලෙජර් පිටුව |
|---|---|---|---|---|---|---|
| 2017/03/05 | 15 | මානෙල් සහ සමාගම | ×× | × | ×× | |
| 2017/04/29 | 16 | කුමාර සහ සමාගම | × | × | ×× | |
| 2017/03/31 | | පොදු ලෙජරයට පිටපත් කළා | ×× | × | ×× | |

ඒ ඒ දිනයන්හි VAT ද ඇතුළත් මුළු වටිනාකම ණයහිමි උපලෙජරයේ අදාළ ණයහිමි ගිණුම්වලට වෙන් වෙන් ව හර කළ යුතු යි.

කාලච්ඡේදය අවසානයේ ආපසු යැවුම් ජර්නලයේ වටිනාකම් තීරුවේ එකතුව පොදු ලෙජරයේ ආපසු යැවුම් ගිණුමට බැර කළ යුතු අතර VAT තීරුවේ එකතුව VAT ගිණුමට බැර කළ යුතු ය. පසුව VAT ද ඇතුළත් මුළු වටිනාකම් තීරුවේ එකතුව ණයහිමි පාලන ගිණුමට හර කළ යුතු ය.

# ආපසු යැවුම් ජර්නලයට අදාළ ගනුදෙනු ලෙජරයට පිටපත් කිරීම

| | | |
|---|---|---|
| අදාළ ණයහිමි පාලන ගිණුම හර | | මුළු වටිනාකම |
| ආපසු යැවුම් ගිණුම | බැර | වටිනාකම් තීරුවේ එකතුව |
| වැට් ගිණුම | බැර | වැට් තීරුවේ එකතුව |

ClassWork.LK

**අභ්‍යාස**

(01) තරිඳු ව්‍යාපාරය නැවත විකිණීම සඳහා අත් ඔරලෝසු 20 ක් මිල දී ගැනීමට 2017/03/02 දින මූර්ති ව්‍යාපාරයට ඇණවුමක් යැවූ අතර, 2017/03/10 දින අත් ඔරලෝසුවක් රු. 1200/- ක් බැගින් මිල සඳහන් කර, තරිඳු ව්‍යාපාරය වෙත ඔරලෝසු 20 ක් එවීය.

ඉල්ලුම් කළ වර්ගයට වඩා වෙනස්වීම මත ඔරලෝසු 10ක් 2017/03/20 වෙනි දින මූර්ති ව්‍යාපාරය වෙත ආපසු යැවීය.

ඉහත සිද්ධියට අනුව තරිඳු ව්‍යාපාරයේ ගනුදෙනු සටහන් කරන මූලික සටහන් පොත් හා ඊට අදාළ මූලාශ්‍ර ලේඛන පහත වගුවේ සඳහන් කරන්න.

| ගනුදෙනුව | අදාළ මූලික සටහන් පොත | මූලාශ්‍ර ලේඛන |
|---|---|---|
| • | • | • |
| • | • | • |

ClassWork.LK

(02) VAT ලියාපදිංචි නොවූ ආයතනයක ආපසු යැවුම් ජර්නලයේ එකතුව පොදු ලෙජරයේ වාර්තා කරන්නේ ?

ගැනුම් ගිණුමට හා ණයහිමි ගිණුමට බැර කරයි.

ණයහිමි ගිණුමෙහි හා ආපසු යැවුම් ගිණුමෙහි හර කරයි.

ආපසු යැවුම් ගිණුමෙහි හා ණයහිමි පාලන ගිණුමෙහි බැර කරයි.

ණයහිමි පාලන ගිණුමෙහි හර කර ආපසු යැවුම් ගිණුමට බැර කරයි.

ආපසු යැවුම් ගිණුමෙහි පමණක් බැර කරයි.

(03) පහත ප්‍රකාශ සත්‍ය ද, අසත්‍ය ද යන්න දක්වන්න.

ගැනුම් ජර්නලය පිළියෙළ කිරීමෙන් පසු වෙළෙඳ වට්ටම් ගිණුම්ගත කෙරේ. (........)

ඒ ඒ හරපතේ ශුද්ධ වටිනාකම අදාළ ණයහිමි ගිණුම්වලට හර කෙරේ. (........)

ClassWork.LK

**(04)**

## ගැනුම් ජර්නලය

| දිනය | ඉන්වොයිසි අංකය | සැපයුම්කරු | වටිනාකම (රු.) | වැට් 10% | මුළු වටිනාකම (රු.) | ලෙජර් පිටුව |
|---|---|---|---|---|---|---|
| 2017/03/05 | 224 | නීතා | 4 500 | 450 | 4 950 | |
| 2017/03/08 | 315 | ගීතා | 12 800 | 1 280 | 14 080 | |
| 2017/03/12 | 228 | ගීතා | 8 200 | 820 | 9 020 | |
| 2017/03/18 | 415 | විනීතා | 6 000 | 600 | 6 600 | |
| 2017/03/25 | 820 | අමිතා | 9 500 | 950 | 10 450 | |
| 2017/03/31 | | පොදු ලෙජරයට පිටපත් කළා | 41 000 | 4 100 | 45 100 | |

## ආපසු යැවුම් ජර්නලය

| දිනය | හරපත් අංකය | සැපයුම්කරු | ටිනාකම (රු.) | වැට් 10% | මුළු වටිනාකම (රු.) | ලෙජර් ටුව |
|---|---|---|---|---|---|---|
| 2017/03/10 | 42 | ගීතා | 1500 | 150 | 1 650 | |
| 2017/03/22 | 43 | විනීතා | 800 | 80 | 880 | |
| 2017/03/31 | | පොදු ලෙජරයට පිටපත් කළා | 2 300 | 230 | 2 530 | |

සටහන : VAT ප්‍රතිශතය 10% කි.

ඉහත සඳහන් අගයන් අදාළ දිනට ලෙජරයට පිටපත් කරන්න.

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති
## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura